**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - 2018**
**------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 7 හි 31 ඡේදය ප්‍රකාරව, වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේදී මූල්‍ය සාධන පත්‍රවලින් (Financial Instruments) පැනනගින අවදානම්වල ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ඇගයීම පහසුවීම සඳහා වූ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15හි 110 ඡේදය ප්‍රකාරව, ගනුදෙනුකරුවන් සමඟ එළඹි ගිවිසුම් මගින් ඇතිවන ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, සංස්ථාව පාර්ශවකරුවෙකු වූ බද්ධ ව්‍යාපාර හා ඖෂධ බෙදාහරින්නන් සමඟ එළඹි ගිවිසුම් මගින් ඇතිවන ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි (සාමාන්‍ය) ගිණුම තුළ පැවති රු.57,212 ක හර ශේෂ එදිනට රු.587,189,088 ක් වූ බැර ශේෂවලට එරෙහිව හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී වත්කම් හා වගකීම් හිලව් නොකිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 117 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීමට අවශ්‍ය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හෙළිදරව් කළ යුතු වුවද, මූල්‍ය බැරකම් සම්බන්ධ ප්‍රතිපත්තිය වැනි වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 30 සහ 31 ඡේද ප්‍රකාරව, නිකුත්කර ඇති එහෙත් තවමත් බලාත්මක නොවන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියක් (SLFRS) අස්ථිත්වයක් විසින් ව්‍යවහාරකර නොමැති විටෙක, ආයතනය විසින් එම කරුණු සහ ආරම්භක ව්‍යවහාරය කරනු ලබන කාලපරිච්ඡේදය තුළ අස්ථිත්වයේ මූල්‍ය ප්‍රකාශවලට අළුත් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියක් (SLFRS) ව්‍යවහාර කිරීමෙන් ඇතිවිය හැකි බලපෑම තක්සේරු කිරීමට අදාළ දන්නා හෝ ඇස්තමේන්තු කළ හැකි තොරතුරු හෙළිදරව් කළ යුතුය. එසේ වුවද, එලෙස වාර්තා කරන දිනට නිකුත්කර ඇති එහෙත් බලාත්මක නොවන නව හෝ සංශෝධිත ප්‍රමිති (උදාහරණ SLFRS 16 - කල්බදු) සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.222,514,842 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| | දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ක්ෂය සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය විධිමත් ලෙස හෙළිදරව් කර නොතිබුණු අතර දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය ඉවත්කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 68 ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂික වගකීම වර්තමාන වටිනාකමට ගැලපීමේදී ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය (projected unit credit method) යොදාගත යුතු වුවද, සංස්ථාව විසින් එම ක්‍රමය යොදා ගත්තේද යන්න පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භෞතික තොග සමීක්ෂණයේදී අනාවරණය වී තිබුණු රු.1,983,315 ක අමතර කොටස් තොග ඌනතා හා රු.213,107 ක අමතර කොටස් තොග අතිරික්තතා ගිණුම් ගත කර නොතිබුණි. | සංස්ථාවේ යන්ත්‍ර හා පිරියත අමතර කොටස් සංගණනයේදී සිදුවී තිබුණු දෝෂ සහ අඩුපාඩු නිසා තොග සංගණනය නැවත සිදුකර Pronto ගිණුම්කරණ පද්ධතියට නිවැරදි තොගය ඇතුළත් කර ඇති බව, නමුත් අතපසුවීමකින් තොග සංගණන ලේඛන සංශෝධනය කර නොමැති බව. | ඉදිරි වර්ෂයේදී මෙම වරද නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ඇසුරුම් ද්‍රව්‍ය ඉතිරි තොගය රු.359,411 කින් අඩුවෙන් ගණනය කර ගිණුම් ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට ඇසුරුම් ද්‍රව්‍ය ඉතිරි තොගය තුළ වූ රු.929,759 ක හානි වූ හා භාවිතා කළ නොහැකි තොගය ලාභයට එරෙහිව කපාහැර නොතිබුණි. ඒ වෙනුවට එම වටිනාකම තොග අතිරික්තයක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. තවද 2018 දෙසැම්බර් 31 දිනට භෞතිකව පැවති රු.358,289 ක ඇසුරුම් ද්‍රව්‍ය ඉතිරි තොගයක්, තොග ඌනතාවයක් ලෙස සලකා ලාභයට එරෙහිව කපාහැර තිබුණි. | දීර්ඝ කාලයක් පුරා වැරදි අංක යටතේ තොගය සටහන් කර ඇති නමුත් මෙවර නිවැරදි අංක යටතේ තොගය සටහන් කර ඇති බව, එපරිදි කටයුතු කිරීමේදී පරණ අංක සහ අළුත් අංක යන දෙක යටතේම ඇසුරුම් තොග ප්‍රමාණයන් ඇතුළත් කිරීමෙන් තොගය වැරදි සහගත ලෙස වැඩියෙන් දක්වා ඇති බව, මෙය ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | ඉදිරි වර්ෂයේදී මෙම වරද නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | අමුද්‍රව්‍ය විකුණුම් අදායම අනෙකුත් මෙහෙයුම් ආදායම් ලෙස හෙළිදරව් කර තිබුණි. නමුත් අමුද්‍රව්‍ය විකුණුම් පිරිවැය රු.2,881,782 ක් වෙළඳ ගිණුමට හරකර තිබුණි. | මෙය ඉදිරි වර්ෂයේදී නිවැරදිව ඉදිරිපත් කරන බව, සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය නිවැරදිව ගණනය කර ඇති බව. | -එම- |
| (ඉ) | ජයිකා (JICA) ආධාර යටතේ ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි භූමි අලංකරන කටයුතු සඳහා වැයකර තිබුණු රු.1,775,625 ක් ජංගම නොවන වත්කමක් ලෙස හඳුනා ගත යුතු වුවද, ඒ වෙනුවට ලාභයෙන් කපා හැර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |

**1.5.3 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු රු.1,435,228,910 කින් රු.4,830,000 ක් වර්ෂ 02 ඉක්මවූ ණය ශේෂ විය. | 2018 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු හිඟ මුදල පියවා ගැනීම සඳහා 2019 ජනවාරි සිට පියවර ගෙන ඇති බව, ඇතැම් අවස්ථාවන්හීදි වෙන් කර ඇති ප්‍රතිපාදන ලබා ගැනීමට නොහැකි වී ඇති බව හා මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා නිසි පියවර ගෙන ඇති බව. | පැරණි ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.2,460,251 ක්වූ අමුද්‍රව්‍ය තොග අයිතම 06 ක් කල් ඉකුත්වී තිබුණි. විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට හා එම තොග විධිමත් පරිදි අපහරණය කර තොග පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමුද්‍රව්‍ය ආයුකාලය දීර්ඝ කරමින් පාවිච්චි කළ නමුත් මෙම ප්‍රමාණයේ ආයුකාලය දීර්ඝ කළ නොහැකි බව තත්ත්ව පාලන අංශය දැනුම් දී ඇති බව, එබැවින් කල් ඉකුත් වූ ඖෂධ ඉවත් කිරීමේ ක්‍රමවේදය අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභයට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමටත්, අදාළ පරිදි අලාභය අයකර ගැනීමටත්, තොග විධිමත් පරිදි අපහරණය කර තොග පොත්වලින් ඉවත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ගවල ගුණත්වය සහ භෞතික ස්වභාවයේ ඇති වී තිබුණු අඩුපාඩු වැනි හේතූන් මත නිෂ්පාදනය අතරමඟ නවතා නැවත නිෂ්පාදනය කිරීමට සිදුවීම හේතුවෙන් වැයවී තිබුණු අතිරේක පිරිවැය රු.17,567,693 ක් විය. සෑම වර්ෂයකදීම නිෂ්පාදන ක්‍රියාවලියේ සිදුවන මෙම අයහපත් තත්ත්වයන් අවම කරගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | ලෝක සෞඛ්‍ය සංවිධානයේ යහපත් නිෂ්පාදන පරිචය (Good Manufacturing Practises) අනුව පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කර ඖෂධ ප්‍රති නිෂ්පාදනය කරන බව, ඖෂධ නිෂ්පාදනයේදී පැනනගින විවිධ තාක්ෂණික ප්‍රශ්න වල ස්වභාවය අනුව ප්‍රති නිෂ්පාදනය කළ හැකි ඖෂධ හා භාවිතයෙන් ඉවත් වන ඖෂධ හඳුනා ගන්නා බව, එකම අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ගෙන් අමුද්‍රව්‍ය මිලදී ගෙන, වෙනස් නොවන වට්ටෝරුවක් හා ක්‍රමවේදයක් යටතේ ඖෂධ නිෂ්පාදනය කළ හැකි වතාවරණයක් තුළ නිෂ්පාදනයේදී සිදුවන මෙවැනි දෝෂ අවම කර ගත හැකි බව. | ඖෂධවල ගුණාත්මක තත්ත්වය පහළ යාම හා නිෂ්පාදන ගැටළු අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.5 විධිමත් අනුමැතියකින් තොරව පොත්වලින් කපාහැරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 ඔක්තෝබර් 01 දින සිට 2019 අගෝස්තු 07 දින දක්වා කාලය තුළදී භාවිතයට ගෙන නොතිබුණු තක්සේරු කළ මුළු පිරිවැය රු.150,397 ක්වූ Condenser Unit එකෙහි වටිනාකම රු.2,957,791 ක් ලෙස සාවද්‍යාව ගිණුම් ගත කර තිබුණි. එම වටිනාකම සමාලෝචිත වර්ෂය තුළදී නිසි අනුමැතියකින් තොරව පොත්වලින් කපා හැර තිබුණි. එය විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 1987 JICA ආධාර යටතේ ලැබුණු Condenser Unit නැමති අමතර කොටස සහිත Auto Still යන්ත්‍රය 2007 වසර පමණ දක්වා පාවිච්චි කළ බව, එහි ක්‍රියාකාරිත්වයේ දෝෂ නිසා යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට උත්සාහ ගත් බව, යන්ත්‍රය 1987 වර්ෂයට පෙර නිෂ්පාදනය කරන ලද්දක් බැවින් නිෂ්පාදිත සමාගම විසින් 2013 වන විට අමතර කොටස් නිෂ්පාදනය කිරීම නවතා දමා තිබුණු බව, යන්ත්‍රයේ සමහර කොටස් අනෙකුත් යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු සඳහා යොදාගෙන ඇති බව, Condenser Unit අයිතමය 2018 වර්ෂයේදී ගිණුම් පොත්වලින් ඉවත් කර ලාභයට එරෙහිව කපා හැරීමට කටයුතු කර ඇති බව. | වත්කම් පොත්වලින් කපා හැරීමට පෙර නිසි අනුමැතිය ලබා ගැනීමට හා විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2004 ජනවාරි 08 දිනැති අංක පීඊඩී 21 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103, 104 , 105 හා 1646 | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, සංස්ථාව සතු මෝටර් රථ 04 කින් මෝටර් රථ 03 ක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත හා එක් මෝටර් රථයක් බාහිර පාර්ශවයක් වෙත භාරදී තිබුණි.<br>අමාත්‍යාංශය වෙත භාරදී තිබුණු මෝටර් රථ 02 ක හා බාහිර පාර්ශවය වෙත භාරදී තිබුණු මෝටර් රථයේ දෛනික ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.<br>අමාත්‍යාංශය වෙත බාරදී තිබුණු මෝටර් රථයක් 2019 ජූලි 26 දින ආපසු සංස්ථාවට බාරදී තිබුණු නමුත් ඒ වන විට මෝටර් රථයට සිදුවී තිබුණු අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම වාහන විශේෂ ව්‍යාපෘති සඳහා බාහිර පාර්ශවයන් වෙත දීමට සිදුවී ඇති බව, දෛනික ධාවන සටහන් පවත්වා නොමැති බව,<br>මයික්‍රෝ වර්ගයේ වාහනය අළුත්වැඩියා කිරීමේදී අධික වියදමක් දැරීමට සිදුවන බැවින් භාවිතයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර ඇති බව, අනතුර සඳහා රක්ෂණ ආයතනයෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නැති බව හා එසේ කලේ නම් වාර්ෂික No claim bonus නොලැබී යාම මගින් ආයතනයට පාඩුවක් වන බව. | වාහන ලබාදී ඇති විශේෂ ව්‍යාපෘති මොනවාද, බාහිර පාර්ශවයන් කවුරුන්ද හා බාහිර පාර්ශව වෙත වාහන ලබාදීමට ඇති අධිකාරී බලය කුමක්ද යන්න හා ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි පිරිවැය රු.23,286,681 ක්වූ අමුද්‍රව්‍ය තොග, පිරිවැය රු.501,986 ක්වූ නිමිද්‍රව්‍ය තොග, පිරිවැය රු.2,765,657 ක්වූ ඇසුරුම් ද්‍රව්‍ය තොග හා මුළු පිරිවැය රු.53,595,221 ක් හා පොත් අගය ශුන්‍ය වූ ස්ථාවර වත්කම් විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මින් බොහොමයක් 2018 වර්ෂයේදී හඳුනාගත් අයිතමයන් වන බව හා විධිමත් ලෙස ඉතා කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වත්කම් විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 10 වැනි වගන්තිය. | එක් නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කළ යුතු වුවද, 2018 වර්ෂයේදී නිලධාරීන් 41 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.4,149,980 ක් ගෙවා තිබුණි. | සංස්ථාවට අදාළ වන්නේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන චක්‍රලේඛ පමණක් බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආපදා ණය ගෙවීම් කර ඇති බව. | සංස්ථාවට ආවේනික වූ පරිපාලනමය හා පාලන රෙගුලාසි ඇතුළත් කරමින් ආයතන සංග්‍රහයක් පිළියෙල කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගන්නා තෙක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ කර ගත යුතුය. |
| (ඇ) | 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ඇමතූ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ ඡේද අංක 02-01 | (i) | සංස්ථාවේ විධායක හා විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය නොසළකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.4,700 ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. 2018 වර්ෂයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව එම මාසික දීමනාව පිළිවෙලින් රු.7,000 ක් හා රු.5,000 ක් දක්වා වැඩිකර මුදල් ගෙවා තිබුණි. | උදෑසන 6.00 සිට රාත්‍රී 10.00 දක්වා සේවා මුර ක්‍රමය ක්‍රියාත්මක කරන බව, සංස්ථාව පොදු ප්‍රවාහන පහසුකම් නොමැති ස්ථානයක පිහිටා ඇති බව, සේවකයන් පදිංචි ස්ථානවල දුර ප්‍රමාණයන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ප්‍රවාහන දීමනාව ගෙවන බව. | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. මේවන විට ගෙවා ඇති දීමනා සම්බන්ධයෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | | (ii) | කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස රු.4,000 ක් පමණක් ගෙවිය හැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2011 ජූලි 01 දින සිට මාසිකව උපරිමය රු.12,000 කට යටත්ව සමස්ත කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වැඩියෙන් ගෙවා තිබුණු රු.18,024,917 ක්ද ඇතුළුව 2011 ජූලි සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී මුළු එකතුව රු.80,744,739 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව නිෂ්පාදන දිරි දීමනාවෙහි පවතින සාධක (Norms) වෙනස් විය යුතුව ඇතැයි සඳහන් කර ඇති බව, ඒ අනුව කමිටුවක් මඟින් පැවති සාධක (Norms) අධ්‍යනය කළ බව, නිෂ්පාදනය දිරි ගැන්වීමේ අරමුණින් සහ කාලීන අවශ්‍යතාවය මත නිෂ්පාදන දිරි දීමනාව පිළිබඳව යෝජනාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ බව හා අධ්‍යක්ෂ මණ්ඩලය එම යෝජනාව අනුමත කළ බැවින් ගෙවීම් කළ බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.251,262,057 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.223,907,939 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,354,118 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායම සියයට 46 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම පිළිවෙලින් රු.204,579,086 ක් හා රු.242,218,982 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 18 කින් වැඩිවී තිබුණි. එහි ඇතුළත් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා රක්ෂණ ප්‍රතිපාදන වියදම සියයට 1314 කින් වැඩිවී තිබීම ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් සියයට 2.4 කින් සහ සියයට 2.3 කින්ද, ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 8.3 කින්ද අඩුවී තිබුණු අතර ණය අයකර ගැනීමේ කාලය දින 48 කින් වැඩිවී තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ගත යුතුය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තත්ත්ව පාලන රසායනාගාරය පුළුල් කිරීමේ කොන්ත්‍රාත් කටයුතු සඳහා උපදේශක ගාස්තු වශයෙන් 2016 සහ 2017 වර්ෂවලදී රු.283,923 ක් ගෙවා තිබුණද, පසුව එම කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩර් කැඳවීම් අත්හිටුවා තිබීම හේතුවෙන් දරනු ලැබූ පිරිවැය අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි. | තත්ත්ව පාලන රසායනාගාරය පුළුල් කිරීමේ කටයුත්ත පාලන අධිකාරිය ගත් තීරණයක් අනුව අත්හිටවූ බව. | විධිමත් සැලසුමකට අනුව කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාව විසින් Cimetidine Tablets BP 200mg ඖෂධය නිෂ්පාදනය කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් ලබාගෙන තිබුණු බලපත්‍රය 2012 මැයි 18 දින කල් ඉකුත් වී තිබුණු නමුත් නව බලපත්‍රයක් ලබාගැනීමට වර්ෂ 06 කට වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි. 2012 මැයි 18 දින සිට 2019 මාර්තු 07 දින දක්වා කාලය තුළ බලපත්‍රයක් රහිතව මෙම ඖෂධයෙන් පෙති මිලියන 39 ක් නිෂ්පාදනය කර අලෙවි කර තිබුණි. | 2019 මාර්තු 13 දින ඖෂධ බලපත්‍රය ලබාගැනීම සඳහා මුදල් ගෙවා ඇති බව, එම නිසා නිෂ්පාදන කටයුතු කරගෙන යාමේ හැකියාව ඇති බව. | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඖෂධ අයිතම 03 ක් නිෂ්පාදනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.9,784,235 ක්වූ අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 4,477 ක් මාස 07 ත් මාස 24 ත් අතර කාලයක් තිස්සේ භාවිතයට ගැනීමෙන් තොරව පැවතුණි. | ඉතිරි අමුද්‍රව්‍යය නිෂ්පාදනය සඳහා නිකුත් කර අවසන් කළ හැකි බව. | අලෙවි සැලැස්ම හා නිෂ්පාදන සැලැස්ම මත පදනම්ව අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ සැලැස්ම පිළියෙල කළ යුතුය. එම සැලැස්මට අනුව අමුද්‍රව්‍ය මිලදී ගෙන කල් ඉකුත්වීම් අවම කරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කෙරෙමින් පැවති ඖෂධ අයිතම 04 කින් කිලෝ ග්‍රෑම් 627 ක් තත්ත්වයෙන් අසමත්වීම හේතුවෙන් නිෂ්පාදනයෙන් ඉවත් කර තිබුණු බැවින් සිදුවී තිබුණු අලාභය රු.1,341,104 ක් විය. | නිෂ්පාදන ක්‍රියාවලිය තුළ තත්ත්වයෙන් අඩු අමුද්‍රව්‍ය හඳුනා ගැනීම සේවකයන්ගේ නිරීක්ෂණය මත පමණක් පදනම්වන බව හා ඒ සඳහා වෙනත් ක්‍රමවේදයක් නොමැති බව, ප්‍රතික්ෂේපිත ප්‍රමාණය ඉතාමත්ම අඩු අගයක පවතින බව, එහෙත් මෙවැනි සිදුවීමකට පසුව නැවත එලෙස සිදුවීම වැලැක්වීමට පියවර ගෙන ඇති බව. | විධිමත් තත්ත්ව පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) අමුද්‍රව්‍ය නොමැතිවීම, යන්ත්‍ර ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචි නොකිරීම ආදී වූ හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධවලින් විකුණුම් මිල රු.113,987,125 ක්වූ ඖෂධ වර්ග 08 කින් ඒකක මිලියන 53.2 ක් සමාලෝචිත වර්ෂය තුළදී සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | ඖෂධ වර්ග 07 ක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචිය සම්බන්ධව ඇතිවූ ගැටළු මත සැපයීම ප්‍රමාද වූ බව, ඖෂධ නියාමන අධිකාරිය බිහිකිරීමත් සමඟ ඇති වී ඇති සංකූලතා මෙයට හේතු වූ බව, මෙයට පිළියමක් ලෙස මෙම කටයුතු වෙනම විධායක නිලධාරියෙකුට පවරා ඇති බව හා මේ වන විට සියයට 100 කින් මෙම ගැටළුව විසඳා ඇති බව, Erythromycin Tablets BP 250mg ඖෂධය තවදුරටත් වෛද්‍ය සැපයුම් අංශය විසින් භාවිතා නොකරන බැවින් නිෂ්පාදනය නොකළ බව. | වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහය ගනිමින් තම වෙළඳපල කොටස ආරක්ෂා කර ගත යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලෝක සෞඛ්‍ය සංවිධානයේ 143 වන විධායක මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති ධූරය ලැබීම වෙනුවෙන් ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත උපහාර පිරිනැමීම සඳහා පවත්වා තිබුණු උත්සවයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,000,000 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව කටයුතු කර ඇති බව. | සංස්ථාවේ අරමුණුවලට පරිබාහිර අරමුණක් වූ උපහාර පිරිනැමීමේ උත්සව සඳහා සංස්ථා මුදල් වැය නොකළ යුතුය. |

**3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පෙනිසිලින් කලාප ගබඩාව සෙපලොස්පොරින් (Cephalosporin) නිෂ්පාදන අංශය ලෙස පරිවර්තනය කිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) 2017 පෙබරවාරි 01 දින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.14,216,622 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. නමුත් වැඩ බිම බාරදීමට මාස 07 කට අධික කාලයක් | ගොඩනැගිල්ලේ ගබඩා කර තිබුණු අමුද්‍රව්‍ය වෙනත් ස්ථානයකට ගෙනයාමට සිදුවීම නිසා වැඩබිම භාරදීම ප්‍රමාදවූ බව, කොන්ත්‍රාත්කරුට අත්තිකාරම් මුදල් නොගෙවා සිටීමෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ අවදානමක් මතුවූ බව හා | විධිමත් සැලසුමකට අනුව කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගතකර තිබුණු බැවින් වැඩ ආරම්භ කර තිබුණු 2017 ජුනි 06 දින වන විට මාස 04 කට අධික කාලයක් අත්තිකාරම් මුදල් කොන්ත්‍රාත්කරු විසින් අත රඳවා ගෙන තිබුණි. සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු ආවස්ථික පිරිවැය ආසන්න වශයෙන් රු.500,000 ක් පමණ විය. | එසේ සිදුවුයේ නම් නැවත මිල ගණන් කැඳවීම තුළ මිල ගණන් ඉහල යෑම වලක්වා ගත නොහැකි බව. | |
| (ii) | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, 2017 මාර්තු 02 දින වන විට වැඩ අවසන් කළ යුතුව පැවතියද, 2019 අගෝස්තු 06 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර ප්‍රමාද කාලය දින 884 ක් විය. | මෙවැනි ඖෂධ නිෂ්පාදනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ උපදේශන ආයතන ශ්‍රී ලංකාවේ නොසිටි බැවින් එවකට සිටි ව්‍යාපෘති කළමණාකාරතුමා යටතේ ඉදිකිරීම් සිදු කළ බව, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ලබාගැනීම හා ගුණාත්මක ඖෂධ නිෂ්පාදනය ප්‍රමුඛතාවය ලෙස සලකා මෙම ඉදිකිරීම කරන බව, ඉදිකිරීම ඉක්මන් කිරීමට වඩා නිවැරදි ලෙස ඉදිකිරීම මගින් නියමිත ප්‍රමිතීන්ට අනුකූල ඖෂධ නිෂ්පාදනය කිරීම අවශ්‍යතාවය වන බව. | -එම- |
| (iii) | විධිමත් ලෙස අනුමත කළ දින දීර්ඝ කිරීම් හෝ ප්‍රමාද ගාස්තු අයකළ බව තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ප්‍රමාද වීම් පිළිබඳ ගාස්තු අයකිරීමක් පිළිබඳව ගිවිසුමේ දක්වා නැති බව. | ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි ගිවිසුම්වලට ඇතුළත් කළ යුතුය. |
| (iv) | කොත්ත්‍රාත් කාලය දීර්ඝවීම හේතුවෙන් කොන්ත්‍රාත් මිල ගණන් රු.3,710,815 කින් එනම් සියයට 6.8 කින් හා උපදේශන ගාස්තු රු.977,542 කින් ඉහළ ගොස් තිබුණි. | ගබඩාව වායු සමනය කිරීමට සිදුවීමත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියට මාස 07 ක් පමණ ගතවීමත් හේතුවූ බව. | විධිමත් සැලසුමකට අනුව කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු කළ යුතුය. |
| (v) | ඉදිකිරීම් අවසන් නොකිරීම හේතුවෙන් Cephalexin Monohydrate BP 2015 ඖෂධය නිෂ්පාදනය කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් ලියාපදිංචි සහතිකය ලබාගැනීමට පෙර ලබා ගත යුතු නිෂ්පාදනාගාරය සඳහා යහපත් නිෂ්පාදන පරිචය (Good Manufacturing Practises) පිළිබඳ සහතිකය ලබාගත නොහැකිව තිබුණි. | නිෂ්පාදනාගාරයේ ඉදිකිරීම් නිමකර ඖෂධ නියාමන අධිකාරියේ අවසර ගත් පසුව මෙම ඖෂධය නිපදවීමට කටයුතු සූදානම් කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (vi) | 2018 අගෝස්තු මාසයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.4,222,836 ක් වූ Cephalosporin Monohydrate BP 2015 කිලෝ ග්‍රෑම් 500 ක අමුද්‍රව්‍ය තොගය උපයෝජනය කළ නොහැකිව තිබුණි. | 2016 වර්ෂයේදී Cephalosporin Zone නමින් නව ඖෂධ කලාපයක් ඉදිකරීමට තීරණය කර තිබුණු බව, ඊට සමගාමීව වට්ටෝරු සංවර්ධන අංශය මගින් නව ඖෂධ සඳහා පරීක්ෂණ අරඹන ලද බව, ඒ අනුව 2018 අග භාගය වන විට ඖෂධය වෙළඳපොලට හඳුන්වා දීම ඉලක්කය වූ බව, එහෙත් ඉදිකිරීම් කටයුතු නිම නොවීම නිසා ඉලක්කය සපුරාගත නොහැකි වූ බව හා මෙම අමුද්‍රව්‍ය ප්‍රමාණය මිලදී ගෙන ඇත්තේ 2018 අග භාගයේ නිෂ්පාදන කටයුතු ඇරඹීම සඳහා බව. | තාත්වික සැලසුමකට අනුව අමුද්‍රව්‍ය මිලදී ගත යුතුය. |
| (ආ) | විනිවිදභාවයකින් තොරව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සමහර මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමෙන් තොරව ඉදිකිරීම් පිළිබඳ උපදේශකයින් හා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන තිබීම, කොන්ත්‍රාත් අවසන් කළ යුතු දිනයන් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි ගිවිසුම්වලට ඇතුළත් කර නොතිබීම, නිසි අනුමැතියකින් තොරව නිරන්තරයෙන් මූලික සැලසුම් වෙනස් කිරීම, සැලසුම් හා ප්‍රමාණපත්‍රවලට අනුකූල නොවන ලෙස ඉදිකිරීම් සිදුකිරීම, කොන්ත්‍රාත් ලිපිගොනු නිසි සැලකිල්ලකින් පවත්වා නොතිබීම හා නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම ආදී වූ කරුණු හේතුවෙන් සංස්ථාවේ කොන්ත්‍රාත් පරිපාලනය දුර්වල මට්ටමක පවතින බව අනාවරණය විය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | විධිමත් සැලසුමකට අනුව කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු කළ යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අදාළව ප්‍රසම්පාදන කාල සටහන විධිමත්ව පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන කාල සටහන අඩුපාඩු රහිතව පිළියෙල කිරීමට වගබලා ගනු ලබන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විභව ආයෝජකයන් වෙත සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර (Joint Ventures) ආරම්භ කිරීම සඳහා යෝජනා කැඳවීම, බද්ධ ව්‍යාපාර පිහිටුවීම, බද්ධ ව්‍යාපාර පවත්වා ගෙන යාම හා එම ව්‍යාපාරවලින් ඖෂධ සපයා ගැනීම පිළිබඳව පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) | සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අභිලාශය ප්‍රකාශ කරන (Expression of Interest) ලෙස ආයෝජකයන් වෙත කරන ලද ආරාධනය 2015 ඔක්තෝබර් 16 දින පුවත්පත් මගින් ප්‍රසිද්ධ කර තිබුණි. නමුත් ඒ වන විට බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2015 වර්ෂයේදී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් සඳහා පිළියෙල කළ යෝජනා අමාත්‍යාංශයට යොමු කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඇති බව, අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ක්‍රියාවලිය පාරදෘශ්‍යභාවයකින් සිදුකළ යුතු වූ බැවින් 2015 ඔක්තෝබර් අභිලාෂ ප්‍රකාශ කිරීම සඳහා වන ආරාධනය ප්‍රසිද්ධ කරන ලද බව. | පූර්ව අනුමැතීන් ලබා ගෙන කටයුතු කළ යුතුය. |
| (ii) | සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට පිළියෙල කර තිබුණු ලේඛන පිළිවෙළින් ව්‍යාපෘති කමිටුව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ සාකච්ඡා සම්මුති කමිටුව (Cabinet Appointed Negotiation Committee) විසින් අනුමත කර නොතිබුණි. | ලංසු විවෘත කිරීමෙන් පසුව ලංසුකරුවන් වෙත යෝජනා ඉදිරිපත් කිරීමේ ලේඛන නිකුත් කර ඇති බව, යෝජනා ලැබුණු පසු ඒවා සියල්ල අමාත්‍යාංශය වෙත යොමු කළ බව, යෝජනා අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩල නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීමට සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කරන ලද බව, එම සාකච්ඡා සම්මුති කමිටුවට සහාය වීම පිණිස ව්‍යාපෘති කමිටුවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කළ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ලැබෙන යෝජනා විවෘත කිරීමේ කමිටුවක් පත් කර නොතිබුණි. තවද එම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.3.6 මාර්ගෝපදේශය | බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ලැබෙන යෝජනා හුදෙක් කැමැත්ත ප්‍රකාශ කිරීමක් වූ බැවින් හා මුදල්මය හෝ තාක්ෂණික වටිනාකමක් නොතිබුණු බැවින් ඒවා විවෘත කිරීම සඳහා විශේෂ කමිටුවක අවශ්‍යතාවයක් නොවූ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාරව, නියමිත ආකෘති පත්‍රයට අනුකූලව යෝජනා විවෘත කිරීම පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් යෝජනා විවෘත කළ දිනය, වේලාව, ලැබුණු යෝජනා ප්‍රමාණය හා යෝජනා ඉදිරිපත් කරන ලද ආයෝජකයින් පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි විය. | | |
| (iv) | සංස්ථාව සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආයෝජකයින් 17 දෙනෙකු සමඟ ගිවිසුම්වලට එළඹී තිබුණු නමුත් ඉන් 10 දෙනෙකු අභිලාශය ප්‍රකාශකිරීම් ඉදිරිපත් කර නොතිබුණු ආයෝජකයින් විය. | නිල කමිටුවේ (Official committee) නිර්දේශ පරිදි අප වෙත පසුව ලැබුණු යෝජනා ඉදිරිපත් කළ ලංසුකරුවන් සඳහාද ලංසු ලේඛන ලබාදුන් බව. | -එම- |
| (v) | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුවේ නිර්දේශය ප්‍රකාරව, බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයාගේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව පාලනය, කළමනාකරණය හා තාක්ෂණික සහාය සංස්ථාව විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා එම ආයෝජකයාගේ ව්‍යාපාරයේ කොටස්වලින් සියයට 10 ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතුය. නමුත් සංස්ථාව වෙත කොටස් නිකුත්කර නොතිබුණු පෞද්ගලික සමාගම් දෙකකින් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,063,106,416 කට ඖෂධ අයිතම 12 ක් සපයා ගෙන වෛද්‍ය සැපයුම් අංශය වෙත අලෙවි කර තිබුණි. එසේම එම පෞද්ගලික සමාගම් | 2019 ජුනි 14 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී කොටස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇති බව හා ඉදිරියේදී කොටස් මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුවේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙකෙහි නිෂ්පාදන සම්බන්ධයෙන් කිසිදු තත්ත්ව පාලනයක්, කළමනාකරණයක් හෝ තාක්ෂණික සහායක් සංස්ථාව විසින් සපයා නොතිබුණි. | | |
| (vi) | බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයා විසින් එක් එක් ඖෂධ අයිතම සඳහා ඉදිරිපත් කර තිබුණු පිරිවැය පත්‍රිකා ස්වාධීන පාර්ශවයකින් සහතික කර නොතිබුණි. | පිරිවැය පත්‍රිකා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි ඇතුළු මිල කමිටුව විසින් පරික්ෂා කරනු ලබන බව. | බද්ධ ව්‍යාපාරයේ පිරිවැය පත්‍රිකා ස්වාධීන පාර්ශවයකින් ලිඛිතව සහතික කරවා ගත යුතුය. |
| (vii) | බද්ධ ව්‍යාපාරය හා සංස්ථාව වෙන් වෙන්ව ලාභ ආන්තිකයන් ලබා ගෙන තිබීම හේතුවෙන් බද්ධ ව්‍යාපාරයක් ගොඩ නැගී නොතිබුණු අතරම අපේක්ෂිත පරිදි අවම පිරිවැයක් යටතේ ඖෂධ සපයා ගැනීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව පිරිවැය මත සියයට 20 ක ලාභාන්තිකයකට අදාළ නිෂ්පාදනය කරනු ලබන බද්ධ ව්‍යාපාරය හිමිකම් ලබන අතර එම මිල මත සියයට 6 ක සේවා ගාස්තුවක් එකතු කිරීමට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට හිමිකම් ඇති බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |
| (viii) | නිල කමිටුවේ නිර්දේශය ප්‍රකාරව, බද්ධ ව්‍යාපාරය සඳහා ගිවිසගත් ආයෝජකයා විසින් නිෂ්පාදනය කරන ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍යවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20 ක ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කළ යුතු විය. නමුත් එම නිර්දේශයට පටහැනිව ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍යවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20 කට වඩා අධික ලාභ හා සේවා ගාස්තු එකතු කර විකුණුම් මිල තීරණය කර තිබුණු අවස්ථා පහත පරිදි විය. | | |

| | | |
|---|---|---|
| ❖ සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජකයින් විසින් නිෂ්පාදනය කර තිබුණු ඖෂධ අයිතම 08 ක මුළු නිෂ්පාදන පිරිවැය රු.297,522,198 ක් වී තිබුණි. ඊට රු.44,574,789 ක ලාභ එකතුකර ඉන්වොයිස් වටිනාකම රු.342,096,987 කට සංස්ථාව වෙත සපයා තිබුණි. සංස්ථාව විසින් ඉන්වොයිස් වටිනාකමට රු.20,543,677 ක සේවා ගාස්තු එකතු කර රු.362,640,664 කට වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණි. ඖෂධ 08 හි මුළු පිරිවැයෙන් සියයට 14.98 ක ලාභ ආන්තිකයක් ආයෝජකයා විසින්ද ඉන්වොයිස් මිලෙන් සියයට 6.00 ක සේවා ගාස්තුවක් සංස්ථාව විසින්ද උපයා තිබුණි. ඒ අනුව මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 21.89 ක් ලාභ හා සේවා ගාස්තු වශයෙන් එකතුකර විකුණුම් මිල තීරණය කර තිබුණි. | කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව පිරිවැය මත සියයට 20 ක ලාභාන්තිකයකට බද්ධ ව්‍යාපාරය හිමිකම් ලබන අතර එම මිල මත සියයට 6 ක සේවා ගාස්තුවක් එකතු කිරීමට සංස්ථාවට හිමිකම් ඇති බව හා සියයට 20 ක ලාභාන්තිකයක් ඉක්මවා නැති බව. | නිල කමිටුවේ නිර්දේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ❖ නිල කමිටුවේ නිර්දේශය ප්‍රකාරව, ඖෂධ හා වෛද්‍ය උපකරණ නිෂ්පාදනය කරන සමාගම් සමඟ පමණක් බද්ධ ව්‍යාපාර පිහිටුවිය යුතුවේ. නමුත් ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය නිෂ්පාදනය නොකර බෙදාහැරීම පමණක් | බද්ධ ව්‍යාපාර ගිවිසුමේ ඡේද අංක 3.15.2 යටතේ යම් නිෂ්පාදකයෙකුට, තමන්ට එම නිෂ්පාදනය ලබාදිය නොහැකි අවස්ථාවලදී වෙනත් දේශීය නිෂ්පාදිතයෙකුගෙන් එම නිෂ්පාදනය ලබාගෙන සැපයීම සිදුකිරීමට අවස්ථාව ඇති බව, ඒ අනුව ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගම, අවසරලත් බෙදාහරින්නා සහ සංස්ථාව ත්‍රෛයි පාර්ශවීය | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පනත ප්‍රකාරව අවශ්‍ය ලියාපදිංචි නොවූ සහ බලපත්‍ර ලබා නොගත් නිෂ්පාදකයින් සමඟ බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසුම්ගත නොවිය යුතුය. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |

සිදු කරන පෞද්ගලික සමාගමක් සමඟ බද්ධ ව්‍යාපාරයක් සඳහා ගිවිසුම් ගත වී තිබුණි. 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 82(1) වගන්තිය ප්‍රකාරව, එම පෞද්ගලික සමාගම වෛද්‍ය උපකරණ නිෂ්පාදනය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබා ගෙන නොතිබුණි. එම සමාගමෙන් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු Crape Bandage 7.5cm x 4.5m ඒකක 473,800 ක එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත් මුළු නිෂ්පාදන පිරිවැය රු.42,349,476 ක් වී තිබුණි. ඊට රු.6,444,624 ක ලාභ එකතු කර ඉන්වොයිස් වටිනාකම රු.48,794,100 කට සංස්ථාව වෙත සපයා තිබුණි. සංස්ථාව විසින් ඉන්වොයිස් වටිනාකමට රු.5,076,960 ක සේවා ගාස්තු එකතුකර රු.53,871,060 කට වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණි. මෙම අයිතමයෙහි මුළු පිරිවැයෙන් සියයට 15.22 ක ලාභ ආන්තිකයක් ආයෝජකයා විසින්ද ඉන්වොයිස් මිලෙන්

ගිවිසුමකට 2019 මැයි 30 දින එළඹී ඇති බව, අවසරලත් බෙදාහරින්නා විසින් වෛද්‍ය උපකරණ ඇණවුම් කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි බලපත්‍ර ලබාගෙන ඇති බව.

| | | | |
|---|---|---|---|
| | සියයට 10.4 ක සේවා ගාස්තුවක් සංස්ථාව විසින්ද උපයා තිබුණි. ඒ අනුව මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 27.2 ක් ලාභ හා සේවා ගාස්තු වශයෙන් එකතු කර විකුණුම් මිල තීරණය කර තිබුණි. | | |
| (ix) | සමාලෝචිත වර්ෂයේදී බද්ධ ව්‍යාපාර වෙතින් සපයාගත් ඖෂධ අයිතම 10 කින් එක් ඖෂධ අයිතමයක පමණක් තත්ත්ව පරීක්ෂාව සිදුකර තිබුණි. | බද්ධ ව්‍යාපාර සමඟ ඇතිකරගෙන තිබෙන ගිවිසුම් ප්‍රකාරව, සසම්භාවීව නියැදි පරීක්ෂා කරන නමුත් සියයට 100 ක් පරීක්ෂා නොකරන බව, සංස්ථාවේ විද්‍යාගාර පහසුකම් තාක්ෂණිකව මෙන්ම මානව සම්පත් අංශයෙන්ද දියුණු වෙමින් පවතින බැවින් එම කටයුතු නිම වීමෙන් පසුව මෙම සියලුම පරීක්ෂණයන් මීට වඩා උපරිමව සිදු කළ හැකි බව. | සංස්ථාව විසින් සපයනු ලබන සියළුම ඖෂධ හා වෛද්‍ය උපකරණ වර්ගවල තත්ත්වය පිළිබඳ උසස් තහවුරුවක් ලබා ගත හැකි පරිදි පද්ධතිය සැකසිය යුතුය. |
| (ඇ ) | පැසිඩෝල් ප්‍රවර්ධන කටයුතු සඳහා රූපවාහිනී යන්ත්‍ර 300ක් රජයේ රෝහල්වල සවිකිරීම වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනය වෙත රු.13,860,000 ක් ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) මාර්ගෝපදේශයට පටහැනිව, අවස්ථා දෙකකදී සියයට 70ක අත්තිකාරම් ලෙස රු.11,380,446 ක් එම ආයතනය වෙත ගෙවා තිබුණි. අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් සහ කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. | සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල වෙළඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනි ආයතනය මඟින් කරවාගැනීම අමාත්‍ය මණ්ඩලය විසින් අනිවාර්ය කර ඇති බැවින් එම ආයතනය සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව සියයට 70 ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇති බව, සැලසිනෙ රූපවාහිනී ආයතනය රජයේ ආයතනයක් බැවින් කොන්ත්‍රාත්තුව නිම නොකිරීමේ අවදානම ඉතා අඩු මට්ටමක පැවතුණු බැවින් කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොමැති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගිවිසුම ප්‍රකාරව, වගකීම් සහතික ලබා ගත යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් වටිනාකම රු.16,007,188 ක් වූ වානේ ව්‍යුහ ගුදම හා කොන්ත්‍රාත් වටිනාකම රු.15,018,184 ක් වූ ගුවන් පාලම ඉදිකිරීමේ කොන්ත්‍රාත් දෙක සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) | ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත්කර නොතිබුණු අතර ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි. | මේවන විට පොදු ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත්කර ඇති බව, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු වාර්තා පොතක සටහන් කරන නමුත් වෙනත් ආකෘති පත්‍රයක සටහන් කර නොමැති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා පිළිවෙලින් සති 19 ක් හා සති 26 ක් ගත කර තිබුණි. වැඩිපුර ගත කර තිබුණු කාලය පිළිවෙලින් සති 15 ක් හා සති 22 ක් විය. | තාක්ෂණික ඇගයීමේ කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දීමට කල් ගතවීම ප්‍රමාදයට හේතුවී ඇති බව. | -එම- |
| (iii) | වානේ ව්‍යුහ ගුදම ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුගෙන් කාර්යයසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. | වානේ ව්‍යුහ ගුදම ඉදිකිරීම සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොමැති බව. | -එම- |
| (iv) | 2018 දෙසැම්බර් 31 දින වන විට වානේ ව්‍යුහ ගුදම ඉදිකිරීමේ වැඩ අවසන් කර තිබුණු නමුත් ගොඩනැගිල්ලේ ඉහළ මහලයේ වැහි පිහිලි තුළින් ජලය ඇතුළට ගලා ඒම නිසා ඉහළ මහල භාවිතා කළ නොහැකි තත්ත්වයකට පත්වී තිබුණු බව 2019 ජූලි 25 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | 2019 අගෝස්තු මාසය වන විට අඩුපාඩු නිවැරදි කර භාවිතයට ගනු ලබන බව. | කොන්ත්‍රාත් වැඩ නිසි අධීක්ෂණයකින් ඉටුකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (v) | වානේ ව්‍යුහ ගුදම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් මිලදීගෙන තිබුණු සියළු අමුද්‍රව්‍ය සඳහා කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවා තිබුණු නමුත් ඉන් වටිනාකම ගණනය කර නොතිබුණු අමුද්‍රව්‍ය තොගයක් ඉතිරිවී තිබුණි. නමුත් එම අමුද්‍රව්‍ය තොගය තොග පොත්වලට ගෙන නොතිබුණි. | ඉතිරි අමුද්‍රව්‍ය යෝජිත ගුවන් පාලම සඳහා පාවිච්චි කිරීමට තීරණය කළ බව. | ඉතිරි අමුද්‍රව්‍ය තොග පොත්වලට ඇතුළත් කර අවශ්‍ය අවස්ථාවලදී නිකුත් කළ යුතුය. |
| | (vi) | ගුවන් පාලම ඉදිකිරීමේ වැඩ ආරම්භ කළ යුතු දිනය වූ 2018 ජූලි 05 දින සිට 2019 පෙබරවාරි 05 දින දක්වා මාස 07 ක ප්‍රමාදයකින් පසුව වැඩ ආරම්භ කර තිබුණි. | හිස් ප්ලාස්ටික් බෝතල් ගබඩාව හා ගුවන් පාලම ඉදිකිරීමේ කොන්ත්‍රාත් දෙකම එක් කොන්ත්‍රාත්කරුවෙකු විසින් සංස්ථා පරිශ්‍රයේ සිදුකිරීමට නියමිත බව, දෛනික මෙහෙයුම් කටයුතුවලට ඇතිවන බාධා සැලකිල්ලට ගනිමින් හිස් ප්ලාස්ටික් බෝතල් ගබඩාව ඉදිකිරීම අවසන් වන තෙක් ගුවන් පාලම ඉදිකිරීම ප්‍රමාද කළ බව. | විධිමත් සැලසුමකට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | | මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.82,994,567ක් වූ සිව් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳව පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| | (i) | මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.3,384,500 ක් වූ උළුඅහු, දොර හා ජනෙල් හා වානේ අත්වැට යන අයිතම 03 ක් සැලැසුම්වල හා ප්‍රමාණ පත්‍රවල සඳහන් ප්‍රමාණයන්ට වඩා අඩුවෙන් ඉදිකර තිබුණි. ඒ පිළිබඳව නොසලකා එම අයිතමවලට අදාළ සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම ගෙවා තිබුණි. | ඇස්තමේන්තු කළ පරිදි සංස්ථාවේ සවිකර ඇති දොරවල්වලට සමාන දොරවල් වෙළඳපලේ නොතිබුණු බැවින් වෙළඳපලේ පවතින දොරවල් යෙදීමට සිදුවූ බව, ඇස්තමේන්තු ඇලුමිනියම් අයිතමයන්ට අදාළ මිණුම් (Section Size) වෙළඳපලේ නොතිබුණු බැවින් වෙළඳපලේ පවතින ආදේශක යොදා ගත් බව, ප්‍රමාණ සමීක්ෂක (quantity surveyor) සමඟ එක්ව ගනු ලබන මිණුම් පරීක්ෂාවෙන් අනතුරුව හා මෙම අඩුපාඩු නිවැරදි කරගත් පසු අවසන් බිල ගෙවීමට කටයුතු කරන බව. | ඇස්තමේන්තු සැලසුම් හා ප්‍රමාණ පත්‍රවල සඳහන් ප්‍රමාණයන්ට වඩා අඩු ප්‍රමාණයකින් යුතු ඉදිකිරීම් සඳහා අනුපාතිකව අඩු කිරීම් සිදුකර ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2016 වර්ෂයේ සිට මුළු මුදල රු.118,589,409 ක් වැය කර 2018 ඔක්තෝබර් 12 දින වන විට ඉදිකිරීම් අවසන්කර විවෘත කර තිබුණු ගොඩනැගිල්ල වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීම සම්පූර්ණ කර නොතිබීම හා ඉදිකිරීම් අඩුපාඩු පැවතීම හේතුවෙන් 2019 අගෝස්තු 20 දින වන විටත් නිසි උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් වුවත්, වායු සමීකරණ පද්ධතිය සවිකිරීමේ කාර්යය සහ ගෘහභාණ්ඩ මිලදී ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් පාවිච්චි කළ නොහැකිවූ බව. | ගොඩනැගිල්ල උපයෝජනය සඳහා විධිමත් සැලසුමකට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීමේ අරමුණින් රු.88,000,000ක් වැයකර 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ගොඩනැගිල්ලක් නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකම රු.33,468,608 ක්වූ කොන්ත්‍රාත්තුව 2018 මැයි 08 දින පිරිනමා තිබුණි. 2019 අගෝස්තු 02 දින වනවිට කොන්ත්‍රාත්කරු වෙත රු.22,856,750 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) | මහල් හතරෙහිම දොර සහ ජනේල සඳහාවූ (Door Type/ window Type) විස්තරාත්මක සැලසුම් (Detail Drawings) විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දොර සහ ජනේල සඳහා වන වැඩ විස්තර ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කර තිබුණු නමුත් වෙළඳ පොළේ පවත්නා ප්‍රමාණයන්ට අනුව ආදර්ශ සපයා පසුව අනුමත කළ බව. | ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා වන සියළු විස්තරාත්මක සැලසුම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | වහලය ඉදිකිරීම සඳහා වූ වැඩ විස්තරයට අනුව, වැහි පිහිලි හා ජල බස්නා නල සවිකර නොතිබුණි. නමුත් එම අයිතමය සඳහා මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.531,037 ක් ගෙවා තිබුණි. | අයිතමය සඳහා යොදා ඇති ප්‍රමාණයෙන් විශාල ලී සඳහා අමතර ගෙවීමක් කිරීමට සිදුවන බව, එම ලී සඳහා මිල ගණන් ඉදිරිපත් කළ විට එම අයිතමය සඳහා සම්පූර්ණ මුදල ගෙවිය හැකි බව. | වැහි පිහිලි හා ජල බස්නා නල සවිකර ගැනීමට හෝ එම අයිතම දෙකට අදාළ මුදල් කොන්ත්‍රාත්කරුගෙන් හෝ ගෙවීම් නිර්දේශ කළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ගොඩනැගිල්ල පිහිටි භූමියේ කොටසක් පමණක් ආවරණය වන සේ ඉදිකර තිබුණු යකඩ දැල් වැටෙහි දිග අඩි 132 ක් පමණක් වුවද, ඒ සඳහා ඉටු කළ දික් අඩි ප්‍රමාණය 394.5 ක් වන බවට සාවද්‍ය සටහන් යොදා රු.219,455 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | අයිතමයට අදාළ මිනුම් සටහන් කිරීමේදී අතපසුවීමකින් මෙය සිදුවී ඇති බව, ඉදිරි බිල් පතෙන් මෙය නිවැරදි කරන බව. | වැඩියෙන් ගෙවීම් කොන්ත්‍රාත්කරුගෙන් හෝ ගෙවීම් නිර්දේශ කළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | ප්‍රමාණ පත්‍රයෙහි සඳහන් වැඩ විස්තරයට අනුකූල නොවන ලෙස යකඩ දැල් වැට ඉදිකර තිබුණු නමුත් ඒ පිළිබඳව නොසලකා මෙම අයිතමය සඳහා මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.329,810 ක් ගෙවා තිබුණි. | -එම- | -එම- |
| (v) | ගොඩනැගිල්ලට සපයා තිබුණු පානීය ජලය ලබාගන්නා කුඩා ලිඳෙහි ජල ධාරිතාවය ප්‍රමාණවත් නොවූ අතර එම ලිඳ, වැසිකිළි අප ජලය රඳවා තබන ගලිවලට හා අපවිත්‍ර ඇල මාර්ගයට ආසන්නයේම පැවතුණි. ජලයේ ගුණත්වය පිළිබඳව පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ආරම්භක අවස්ථාවේ පුහුණු පාසල සඳහා බඳවා ගනු ලැබීමට අදහස් කර ඇත්තේ සිසුන් 30 ක කණ්ඩායමක් බව, අවශ්‍ය ජලය ලබාගැනීම සඳහා කුඩා ප්‍රමාණයේ ප්‍රතිලෝම ඔස්මෝසිස් (Reverse Osmosis) පද්ධතියක් සවිකිරීමට අදහස් කරන බව. | පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | ගොඩනැගිල්ල වායුසමීකරණ කර නොතිබුණු අතර ඉදිකිරීම් සහ නවීකරණයන් සඳහා අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුකූලතා සහතිකය (Certificate of Conformity) ලබාගෙන නොතිබුණි. | පිරිවැය ඉහළයාම නිසා මෙම අයිතමය ඉවත් කර ඇති බව හා ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | ප්‍රාදේශිය සභාව විසින් අනුමත කර තිබුණු සැලැස්මට අදාළ කොන්දේසි ක්‍රියාත්මක කළ යුතුය. අනුකූලතා සහතිකය ලබා ගත යුතුය. |
| (vii) | මිලදී ගත් ගොඩනැගිල්ලෙහි පැවති අක්‍රීය විදුලි සෝපානය භාවිතා කළ නොහැකි ලෙස වසා දමා තිබුණු අතර මහල් 4කින් යුක්ත ගොඩනැගිල්ල සඳහා විදුලි සෝපානයක අවශ්‍යතාවය පැවතුණි. | මෙම විදුලි සෝපානයේ පිවිසුම් වසාදැමීමට වැඩබිම් රැස්වීම්වලදී තීරණය කළ බව. | ගොඩනැගිල්ල සඳහා විදුලි සෝපානයක් සපයා ගත යුතුය. |
| (viii) | ගොඩනැගිල්ල නවීකරණය සඳහා වූ මූලික සැලසුම්වල අභ්‍යන්තර දත්ත රැහැන් (Data Cable) සහ දුරකථන රැහැන් ඇදීම ඇතුළත් වුවද, එම රැහැන් සඳහා වන පිටත ආවරණ (Conduits) පමණක් යොදා තිබුණි. | අභ්‍යන්තර දත්ත රැහැන් නොඇදීමට වැඩබිම් රැස්වීම්වලදී තීරණය කළ බව. | අවශ්‍යතාවය පරිදි අභ්‍යන්තර දත්ත රැහැන් (Data Cable) සහ දුරකථන රැහැන් යෙදිය යුතුය. |
| (ix) | කොන්ත්‍රාත්තුව අවසන් කර බාරදී තිබුණු නමුත්, රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීම සඳහා සපුරාලිය යුතු අනෙකුත් අවශ්‍යතා කිසිවක් සඳහා සංස්ථාවේ පෙර සැලැස්මක් හෝ සූදානමක් දැකිය නොහැකි විය. | පුහුණු පාසල ආරම්භ කිරීම සඳහා සිසුන් බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කර ඇති බව,<br>රසායනාගරය සඳහා උපදේශන සමාගමක සහය යටතේ අවශ්‍ය සැලසුම් සකස් කිරීම ඉදිරියේදී සිදු කරන බව, | ගොඩනැගිල්ල උපරිමයෙන් උපයෝජනය සඳහා සැලසුමකට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | යෝජිත කාර්මාන්ත ශාලාවල නිෂ්පාදනය ආරම්භ කළ පසු රසායනාගරය පාවිච්චි කිරීම සඳහා යටිතල පහසුකම් පමණක් දැනට ස්ථාපිත කර ඇති බව. | |
| (ඇ) | සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන කොන්ත්‍රාත් කටයුතුවලදී උපදේශකයින් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹෙන ගිවිසුම්වලට ඉදිකිරීම් අවසන් කළ යුතු නිශ්චිත දිනය හා අය කරනු ලබන ප්‍රමාද ගාස්තු පිළිබඳ නිශ්චිත කොන්දේසි ඇතුළත් කර නොතිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදාන ලිපියේ ඉදිකිරීම් ආරම්භ කළ යුතු දිනය දක්වා ඇති බව. | කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹෙන ගිවිසුම්වල ඉදිකිරීම් අවසන් කළ යුතු නිශ්චිත දිනය හා අය කරනු ලබන ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි ඇතුළත් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
---------------------------------------------

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**
--------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව විසින් 2018 – 2022 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 25ක් ඉටුකිරීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකි විය. | සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් එක් එක් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉටු කර ගත හැකි වූ වැඩ කොටස් පමණක් ඉටුකර ඇති බව. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 27 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකරගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. තවත් ක්‍රියාකාරකම් 18 ක් ඉටුකිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙසින් පමණක් දක්වා තිබුණු බැවින් එම ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව මැනිය නොහැකි විය. | -එම- | -එම- |